පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# දෙවන වාර පරීක්ෂණය - 2019
# කතෝලික ධර්මය

පාසලේ නම : ..........................................................................................
ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..............................................
..........................................................................................................................

කාලය : පැය 01 යි.

## I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**නිවැරදි පිළිතුර තෝරා කොටු කොළයේ අංකය සලකුණු කරන්න.**

01. කිතුනුවන්ගේ අති පූජනීය ග්‍රන්ථය ලියවී ඇත්තේ,
    (1) විවිධ පුද්ගලයන් මගිනි. (2) දිවැසිවරුන් මගිනි.
    (3) සුවිශේෂක කතුවරුන් විසිනි. (4) දේවානුභාවයෙනි.

02. එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථයකි.
    (1) උත්පත්ති (2) දානියෙල් (3) ජෙරමියා (4) හිතෝපදේශය

03. ලූක් සුබාරංචියේ දෙවන කාණ්ඩය පිළිගන්වා ඇත්තේ,
    (1) තියෝපිලස්ට ය. (2) ශුද්ධ වූ පේදුරුරු තුමාට ය.
    (3) නිකදේමුස්ට ය. (4) ශුද්ධ වූ පාවුලු තුමාට ය.

04. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම පියවර,
    (1) 2 කි. (2) 4 කි. (3) 3 කි. (4) 5 කි.

05. ශුද්ධවූ පාවුලුතුමාගේ ලිපිවල අන්තර්ගතය වනුයේ,
    (1) දේව අනාවරණයන් ය. (2) ගැලවීම පිළිබඳ අනාවැකි ය.
    (3) දේව ධාර්මික හා එඬේරික උපදෙස් ය. (4) ධර්මිෂ්ඨ ජීවිතයකට මගපෙන්වීම් ය.

06. ද්විතීය පාවුලු සංදේශ නම්,
    (1) එපීස, කොලොස්සි (2) 1 තිමති, 2 තිමති
    (3) පිලමොන්, රෝම (4) කොරෙන්ති, ගලාති

07. මිනිසා දෙවියන් වහන්සේ අත්දකිනුයේ,
    (1) ස්වාභාවික විපත් තුළින් ය. (2) සරුසාර අස්වැන්නක් ලැබීමෙන් ය.
    (3) තම ජීවිත තුළින් ය. (4) ශුද්ධ ලියවිල්ල තුළින් ය.

08. නව ගිවිසුමෙහි ඇතුළත් විශ්ව සංදේශ ගණන,
    (1) 7 කි. (2) 8 කි. (3) 5 කි. (4) 4 කි.

Education NCP . www.edncp.lk

09. ගිනිගත් නොදැවෙන පඳුර තුළින් සංකේතවත් වූයේ,

(1) දෙවියන් වහන්සේගේ බලය යි.
(2) දිව්‍ය සංරක්ෂණය යි.
(3) දෙවියන් වහන්සේගේ අභිරහසාත්මක බව යි.
(4) දෙවියන් වහන්සේගේ වැඩසිටීම යි.

10. දේව ආදරයේ සහ ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය වනුයේ,

(1) දිව්‍ය සත්ප්‍රසාදය යි.
(2) කුරුසිය යි.
(3) මිදියුෂ යි.
(4) බැහැපත්කම යි.

11. එළිදරව් සාහිත්‍යයේ 4 හා 12 සංඛ්‍යා සංකේත මගින් එළිදරව් වනුයේ,

(1) විශ්වය, දේව ජනතාව
(2) විශ්වය, පරිපූර්ණත්වය
(3) පූර්ණත්වය, විශ්වය
(4) දේව ජනතාව, පූර්ණත්වය

12. ගිබියොන්හි කඳු මත දෙවිඳුන්ට පූජා ඔප්පු කළේ,

(1) සාවුල් රජතුමා ය.
(2) දාවිත් රජතුමා ය.
(3) සලමොන් රජතුමා ය.
(4) ජෙරබෝවම් රජතුමා ය.

13. ''හැම දෙයකදීම සමිඳුන් සිහි කරන්න. .................................'' හිස්තැනට සුදුසු බයිබල් පාඨය වනුයේ,

(1) එතුමා ඔබට හරි මග පෙන්වනු ඇත.
(2) එතුමා ඔබට නිසි මග පෙන්වනු ඇත.
(3) එතුමා ඔබ සුරකිනු ඇත.
(4) එතුමා ඔබ ශක්තිමත් කරනු ඇත.

14. ජේසුස් වහන්සේගේ ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව වනුයේ,

(1) පන්දහසකට කෑම දීම ය.
(2) දේව මාලිගාවේ පඬිවරුන් මැද දේශනා කිරීම ය.
(3) ගෝලයින් තෝරා ගැනීම ය.
(4) දුක්විඳීම, මරණය හා උත්ථානය ය.

15. ජනතාවගේ ඉල්ලීම මත ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමේ තීන්දුව ප්‍රකාශ කළේ,

(1) උත්තම පූජකයා ය. (2) පිලාත් ය. (3) හෙරෝද් ඇන්ටිපස් ය. (4) රෝම අධිරාජ්‍යයා ය.

16. ජේසුස් වහන්සේගේ මෘත ශරීරය අවසන් කටයුතු කිරීම සඳහා භාරගත්තේ,

(1) පේදුරුතුමා ය. (2) ජාකොබ්තුමා ය. (3) පාවුලුතුමා ය. (4) අරමාතියේ ජෝසප් ය.

17. ''පියාණනි, ඔවුන්ට කමා වුව මැනව, ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති.'' යි වදාළේ,

(1) සොරුන් දෙදෙනා කියූ වදන්වලට ය.
(2) ජුදයින් විසින් සරදම් කරනු ලැබූ අවස්ථාවේ දී ය.
(3) ජේසු තුමාව ජුදයින් විසින් කුරුසියේ තබා ඇණ ගැසූ අවස්ථාවේ දී ය.
(4) පිලාත්ගේ නඩු ශාලාවේ දී ය.

18. ''පෙන්තකොස්ත'' යන්නෙහි අර්ථය වන්නේ,

(1) පනහ ය. (2) සියය ය. (3) ප්‍රඥාව ය. (4) හැට ය.

19. ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වනුයේ,

(1) ශු. මහා ජාකොබ් තුමා ය.
(2) ශු. සන්තියාගෝ මුනිතුමා ය.
(3) ශු. පාවුලුතුමා ය.
(4) ශු. ස්තේපන්තුමා ය.

Education NCP - www.edncp.lk

20. ශුද්ධවූ පාවුලුතුමාගේ ධර්මදූත චාරිකා සඳහා මූලාරම්භය ගත් නගරය වූයේ,

(1) සිරියාවේ අන්තියෝකය ය. (2) ජෙරුසලම ය.

(3) ග්‍රීසිය ය. (4) එපීසය ය.

21. නීරෝ අධිරාජ්‍යයා විසින් ශු. පාවුලුතුමාගේ හිස ගසා මරා දමන ලද්දේ,

(1) ක්‍රි.ව. 58 දී ය. (2) ක්‍රි.ව. 70 දී ය. (3) ක්‍රි.ව. 48 දී ය. (4) ක්‍රි.ව. 68 දී ය.

22. නූතන ලෝකය තුළ අප ක්‍රියාකාරී විය යුත්තේ,

(1) ශ්‍රේෂ්ඨයන් වීමට ය. (2) හොඳ නම ආරක්ෂා කර ගැනීමට ය.

(3) ධනය හා බලය උපයා ගැනීමට ය. (4) ස්වාමීන් වහන්සේට සාක්ෂි දැරීමට ය.

23. "ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය." යි පේදුරුතුමා ප්‍රකාශ කළේ,

(1) ගලීලයේ දී ය. (2) පිලිප්පි කයිසාරියේ දී ය. (3) ජෙරුසලමේ දී ය. (4) සමාරියේ දී ය.

24. සුබ අස්න අසා, බෞතිස්මය ලැබූ විජාතිකයා,

(1) කොර්නේලියස් ය. (2) අනනියස් ය. (3) ජූදස් ය. (4) පාවුලු තුමා ය.

25. අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා කතෝලික සභාවේ කීවන ශුද්ධෝත්තම පියතුමා ද?

(1) 256 (2) 232 (3) 246 (4) 266

26. ශුද්ධවූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්‍ය ලක්ෂණ හතර ගෙනහැර දක්වන පොදු යැදුම වන්නේ,

(1) ස්වාමිවාක් ආරාධනාව ය. (2) ත්‍රිත්ව ස්තෝත්‍රය ය.

(3) විශ්වාස ලක්ෂණය ය. (4) ස්ප්‍රීතු සාන්තු යාච්ඤාව ය.

27. ශ්‍රී ලංකාවේ ශුද්ධවූ සභා ඉතිහාසය ප්‍රධාන යුග කිහිපයකට බෙදා දැක්විය හැකි ද?

(1) 5 කට (2) 4 කට (3) 3 කට (4) 2 කට

28. ක්‍රි.ව. 1705 දී ලංකාවට පැමිණියේ ය. නාට්‍ය කලාව, ග්‍රන්ථකරණය, සංගීතය තුළ විශාල සේවයක් සිදු කර ඇත.

(1) ජුසේ වාස් පියතුමා (2) මයිකල් රුද්‍රිගු පියතුමා

(3) මර්සලින් ජයකොඩි පියතුමා (4) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා

29. 2012 වන විට ශ්‍රී ලංකාවේ රදගුරු පදවි,

(1) 10 කි. (2) 12 කි. (3) 08 කි. (4) 15 කි.

30. පහත සඳහන් ප්‍රකාශ අතරින් පෘතුගීසීන්ගේ ධර්මදූත සේවය මෙරට සාර්ථක වීමට ප්‍රධාන සාධකය වූයේ,

(1) සියලුම කතෝලික පූජකවරුන් පිටුවහන් කිරීම ය.

(2) දේශීය භාෂා ඉගෙන ගෙන ධර්මය ප්‍රචාරය කිරීම ය.

(3) ලතින් භාෂාව ප්‍රගුණ කිරීම ය.

(4) කතෝලික සභාව සතු දේපල රාජසන්තක කිරීම ය.

31. " දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය" ලෙස හැඳින්වෙන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය යි. (2) ප්‍රසාද ස්නාපනය යි.

(3) දිව්‍ය සත්ප්‍රසාදය යි. (4) පූජාත්වරය යි.

Education NCP - www.edncp.lk

32. ජෙරුසලම් නුවර ප්‍රථම වරට පූප හා මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළේ,

(1) පූජක මෙල්කිසදෙක් ය. (2) දිවැසිවර යෙසායා ය. (3) මෝසෙස් ය. (4) ජාකොබ් ය.

33. **නොගැළපෙන** පිළිතුර තෝරන්න.

(1) නව ගිවිසුමට අනුව මහ බ්‍රහස්පතින්දා අන්තිම රාත්‍රී භෝජනය පැවැත්විණි.

(2) එදින බැටළුවෙකු මරා උගේ ලේ නිවසේ උළුවහු කණුවල ගාන ලදි.

(3) එදින දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කරන ලදි.

(4) ජේසුස් වහන්සේ පූජාත්වරය ද ස්ථාපිත කළ සේක.

34. ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ සිද්ධිය ඉස්මතු කරන සුවිශේෂක කතුවරයා වන්නේ,

(1) ශු. ජොහාන් තුමා ය. (2) ශු. මාක් තුමා ය. (3) ශු. මතෙව් තුමා ය. (4) ශු. ලූක් තුමා ය.

35. නොදවන පූජාවකි.

(1) ධාන්‍ය, ගවයන් (2) මිදියුෂ, බැටළුවන් (3) එළුවන්, ගවයන් (4) ධාන්‍ය, තෙල්

36. බටහිර, නැගෙනහිර ලෙස ජර්මනිය වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක් සේසත් කිරීමට මූලික වූයේ,

(1) ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය. (2) ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.

(3) හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය. (4) 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

37. භාග්‍යවත් තෙරේසා මව්තුමිය ආරම්භ කළ පැවිදි නිකාය වනුයේ,

(1) ලොරෙටෝ පැවිදි නිකාය (2) ෆ්‍රැන්සිස්කානු පැවිදි නිකාය

(3) දිව්‍ය සංරක්ෂණයේ පැවිදි නිකාය (4) දයාවේ දූතිකාවෝ පැවිදි නිකාය

38. පූජක දිවිය - සේකව පූජකත්වයට ගෙන යාමට නායකත්වය දුන් පියතුමෙකු වනුයේ,

(1) මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා ය. (2) මයිකල් රුද්‍රිගු පියතුමා ය.

(3) ඩෙස්මන් ටුටු රදගුරුතුමා ය. (4) ලියෝ නානායක්කාර රදගුරුතුමා ය.

39. ''නුඹේ දෙව් සමිඳුණන්ගේ නාමය අගරු ලෙස භාවිත නොකරව. යමෙක් ඒ නාමය අගරු ලෙස භාවිත කරන්නේ ද මම ඔහුට දඬුවම් කරමි.'' මෙය නික්මයාම පොතෙහි සඳහන්,

(1) පළමු පනත යි. (2) දෙවන පනත යි.

(3) තෙවන පනත යි. (4) හතරවන පනත යි.

40. දෙවියන් වහන්සේට වන්දනා කිරීම යනු,

(1) මීසමේ මංගල්‍යය උත්සවශ්‍රීයෙන් පැවැත්වීම ය.

(2) භෞතික වස්තූන්ට වන්දනා කිරීමෙන් වැළකීම ය.

(3) සාන්තුවරයන්ට ආදරය හා ගෞරවය ප්‍රකාශ කිරීම ය.

(4) සියල්ලේම ආධිපත්‍යය දෙවිඳුන් සතු බව පිළිගෙන ප්‍රශංසා කිරීම ය.

(ලකුණු 1X40=40)

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
## කතෝලික ධර්මය
## පිළිතුරු පත්‍රය

### I කොටස

01. (4) දේවානුභාවයෙනි.
02. (2) දානියෙල්
03. (1) තියෝපිලස්ට ය.
04. (2) 4 කි.
05. (3) දේව ධාර්මික හා එඬේරික උපදෙස් ය.
06. (1) එපීස, කොලොස්සි
07. (4) ශුද්ධ ලියවිල්ල තුළින් ය.
08. (2) 8 කි.
09. (4) දෙවියන් වහන්සේගේ වැඩසිටීම යි.
10. (2) කුරුසිය යි.
11. (1) විශ්වය, දේව ජනතාව
12. (3) සලමොන් රජතුමා ය.
13. (1) එතුමා ඔබට හරි මග පෙන්වනු ඇත.
14. (4) දුක්විඳීම, මරණය හා උත්ථානය ය.
15. (2) පිලාත් ය.
16. (4) අරමාතියේ ජෝසප් ය.
17. (3) ජේසු තුමාව ජුදයින් විසින් කුරුසියේ තබා ඇණ ගැසූ අවස්ථාවේ දී ය.
18. (1) පනහ ය.
19. (4) ශු. ස්තේපන්තුමා ය.
20. (1) සිරියාවේ අන්තියෝකය ය.
21. (4) ක්‍රි.ව. 68 දී ය.
22. (4) ස්වාමින් වහන්සේට සාක්ෂි දැරීමට ය.
23. (2) පිලිප්පි කයිසාරියේ දී ය.
24. (1) කොර්නේලියස් ය.
25. (4) 266
26. (3) විශ්වාස ලක්ෂණය ය.
27. (1) 5 කට
28. (4) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
29. (2) 12 කි.
30. (2) දේශීය භාෂා ඉගෙන ගෙන ධර්මය ප්‍රචාරය කිරීම ය.
31. (3) දිව්‍ය සත්ප්‍රසාදය යි.
32. (1) පූජක මෙල්කිසදෙක් ය.
33. (2) එදින බැටළුවෙකු මරා උගේ ලේ නිවසේ උළුවහු කණුවල ගාන ලදි.

34. (1) ශු. ජොහාන් තුමා ය.
35. (4) ධාන්‍ය, තෙල්
36. (1) ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ය.
37. (4) දයාවේ දූතිකාවෝ පැවිදි නිකාය
38. (2) මයිකල් රුදිගු පියතුමා ය.
39. (2) දෙවන පනත යි.
40. (4) සියල්ලේම ආධිපත්‍යය දෙවිඳුන් සතු බව පිළිගෙන ප්‍රශංසා කිරීම ය.

(ලකුණු 1X40=40)

## II කොටස

01. (i) උත්පත්ති/ නික්මයාම/ ලෙවී ව්‍යවස්ථාව/ ගණන් කථාව/ ද්විතීය නීති සංග්‍රහය

(ii) කාලය- ක්‍රි.ව. 80-90/ ස්ථානය- ග්‍රීසියේ ''අක්කායා''

(iii) කාර්ය බහුලත්වය නිසා කිතුනු සංස බැහැදැකීමට යාමේ අපහසුව
සිරගතව සිටීම නිසා කිතුනු සංස බැහැදැකීමට යාමට නොහැකි වීම

(iv) බැටළුවා - ක්‍රිස්තුන් වහන්සේ
මකරා - යක්ෂයා

(v) ප්‍රස්ථාව පිරුළු/ උපදේශ/ කතාන්දර/ ගීත

(vi) ආරම්භය සහ අවසානය

(vii) ප්‍රැන්සිස්කානු පැවිදි නිකාය
අගුස්තීනු පැවිදි නිකාය

(viii) මහනුවර රාජධානියට වර්ෂාව ලබා දීම
දැදුරු ඔයෙන් පා ගමනින් එතෙර වීම
තනි අලියා මෙල්ල කිරීම

(ix) අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමි
අති උතුම් නෝබට් අන්ද්‍රාදි රදගුරු හිමි

(x) ඉච්ඡාභංගත්වය/ අනුමානය

(ලකුණු 2X10=20)

02. (i) ශුද්ධ බයිබලය/ ජීවන සහා සම්ප්‍රදාය (ලකුණු 02)

(ii) ද්විත්ව වාදය/ යුගාන්තවාදය/ සංකේත භාවිතය/ ආරූඪ නාමයකින් ඉදිරිපත් කිරීම (ලකුණු 03)

(iii)
- දිනපතා යාච්ඤා කිරීම
- දේව වචනය තුළ ජීවිතය ගොඩනගා ගැනීම
- ඉගෙනීමේ කටයුතු නිසි ලෙස ඉටු කිරීම ...

ආදී පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03. (i) ජෝබ්/ ගීතාවලිය/ හිතෝපදේශය/ ප්‍රේම ගී ... (ලකුණු 02)

(ii) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව / රාජ්‍ය සභා ප්‍රඥාව / අභිධාර්මික ප්‍රඥාව /
එදිනෙදා ජීවිතය හා සම්බන්ධ ප්‍රඥාව (ලකුණු 03)

(iii)
- අධ්‍යාපන කටයුතුවල නියැලීමේ දී
- ප්‍රේම සබඳතා
- අන්තර්ජාලය, මුහුණු පොත භාවිතයේ දී
- නවීන විලාසිතා තෝරා ගැනීමේ දී

ආදී පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i) සැඩ සුළඟ/ ගිනි දළු (ලකුණු 02)

(ii) යහපත් දිවි පෙවතක් ගත කිරීම/ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම/ ප්‍රඥාවෙන් පූර්ණ වීම (ලකුණු 03)

(iii) ඉගැන්වීම, සහභාගිකම, දිව්‍ය පූජාව, යාච්ඤාව වර්තමාන සභාව තුළ ජීවගන්වන ආකාරය පැහැදිලි
කළ යුතුයි. (ලකුණු 05)

05. (i) බර්ණබස් තුමා/ ජොහාන් මාක් තුමා (ලකුණු 02)

(ii) රෝම/ කොරින්ති/ ගලාති/ එපීස ... (ලකුණු 03)

(iii)
- සුබාරංචිය ලොව තුළ මංශගත කරවීම
- අභියෝගවලට නොබියව මුහුණ දීම
- යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම
- අන් අයට නිසි මඟ පෙන්වීම

ආදී පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) දෙවියන් වහන්සේ හා සම්බන්ධ යුතුකම්/ අසල්වැසියා හා සම්බන්ධ යුතුකම් (ලකුණු 02)

(ii) විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය (ලකුණු 03)

(iii)
- යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්, හූනියම් කිරීම
- අංජනම් බැලීම, නැකත් බැලීම
- නැකතට මුල් ගල් තැබීම ආදී පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

07.

(i) ඒකත්වය, ශුද්ධත්වය, කතෝලිකත්වය, අපෝස්තලිකත්වය යන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කළ යුතුයි.

(ii) මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න/ මාගේ බැටළුවන් පෝෂණය කරන්න/ මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න යන අදහස් පැහැදිලි කළ යුතුයි.

(iii) ක්‍රි.ව. 1948න් පසු යුගය

1961 පාසල් රජයට පවරා ගැනීම

පාසල් අධ්‍යාපනය තුළ ආගමික පරිසරය අහිමි වීම

විදේශීය ධර්මදූතවරුන් තම රටවලට යාම

දීප ව්‍යාප්ත දහම් පාසල් ක්‍රමය ආරම්භ වීම

ආදී කරුණු ඇතුළත් විය යුතුයි.

(iv) උපත 1894-01-08

දේව මාතාවන් දර්ශනය වීම

ව්‍රත ශුද්ධිය හා ප්‍රාණ පරිත්‍යාගිත්වය භාර ගැනීම

සිරකරුවකු වෙනුවෙන් තමා මරණයට පත් කරන ලෙස ඉල්ලීම

''යමකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත''

(ලකුණු 5X2=10)

***


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට
www.lol.lk
Learn Ordinary Level
LOL.lk
online Book Store
LOL.lk
අමතන්න - 071 777 4440/0756999990/071 8540371
G.C.E. O/L PAST PAPERS
අ.පො.ස. සා/පෙළ
පසුගිය විභාග ප්‍රශ්නෝත්තර
2010 සිට 2019 දක්වා
A+ GUIDE PAST PAPERS
සමනල දැනුම
ගණිතය
MATHEMATICS
විද්‍යාව
SCIENCE
ඉතිහාසය
HISTORY
සිංහල භාෂාව හා සාහිත්‍යය
SINHALA LANGUAGE AND LITERATURE
සංගීතය (පෙරදිග)
MUSIC (ORIENTAL)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
INFORMATION & COMMUNICATION TECHNOLOGY
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
HEALTH AND PHYSICAL EDUCATION
භූගෝල විද්‍යාව
GEOGRAPHY
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
නාට්‍ය හා රංග කලාව
DRAMA AND THEATRE
නැටුම් (දේශීය)
DANCING (ORIENTAL)
කතෝලික ධර්මය
CATHOLICISM
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
BUSINESS & ACCOUNTING STUDIES
බුද්ධ ධර්මය
BUDDHISM
චිත්‍ර
ART
Ex/Press/2019/0034
Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY
ISLANDWIDE
SECURE
PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඔඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE



An evening of fun for young readers